# බප/කළු සාන්ත මරියා විද්‍යාලය, මග්ගොන

# බුද්ධ ධර්මය - කෙටි සටහන්

**පස් මහ බැලුම්(පංච මහා විලෝකනය)**

කාලය, දීපය, දේශය, කුලය, මව

**කුසල මූල** - අලෝභ, අදෝස, අමෝහ

**අකුසල මූල** - ලෝභ, දෝස, මෝහ

**සතර පෙර නිමිති**

මහල්ලෙක්
ලෙඩෙක්
මළකඳක්
පැවිදි රුවක්

**සතර සංග්‍රහ වස්තු සිව් සඟරාවත්**

දානය
ප්‍රිය වචනය
අර්ථ චර්යාව
සමානාත්මතාවය

**චතුරාර්ය සත්‍යය (සිව් සස්)**

දුක්ඛ ආර්ය සත්‍ය - දුක
දුක්ඛ සමුදය ආ.ස. - දුකට හේතුව
දුක්ඛ නිරෝධ ආ.ස. - දුක නැති කිරීම
දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා ආ.ස.- දුක නැති කිරීමේ මාර්ගය

**තෙරුවන්/ත්‍රිවිධ රත්නය**

බුද්ධ, ධම්ම, සංඝ

**ත්‍රිලක්ෂණය**

අනිත්‍ය, දුක්ඛ, අනාත්ම

**සතර මහා භූත**

පඨවි
ආපෝ
තේජෝ
වායෝ

**සතර අගතිය**

ඡන්දය
ද්වේශය
භය
මෝහය

**සතර බ්‍රහ්ම විහරණ/ සිව් බඹ විහරණ/ චතු අප්පමඤ්ඤා**

මෙත්තා , කරුණා
මුදිතා , උපේක්ඛා

**සිව්පසය**

චීවර
පිණ්ඩපාත
සේනාසන
ගිලානපච්චය

**අටලෝ දහම/ අෂ්ඨ ලෝක ධර්ම**

ලාභ, අලාභ, යස, අයස,
නින්දා, ප්‍රශංසා, සැප, දුක

**ත්‍රිශික්ෂාව**

ශීල, සමාධි, ප්‍රඥා

**ත්‍රිවිධ චෛත්‍ය**

ශාරීරික, පාරිභෝගික, උද්දේසික

**තුන්තරා බෝධිය**

බුදු, පසේ බුදු, මහ රහත්

**පංච නීවරණ - සිත කිලිටි කරන අකුසල් සිතිවිලි**

**1.කාමච්ඡන්ද** - කාම වස්තු කෙරෙහි ආශාව ( වර්ණ එක්කල ජලය ) → ණයගැතියකු ණයහිමියාට බැඳී සිටින්නා සේ කාමච්ඡන්දය ඇත්තාද වහලෙකු මෙන් ඊට යටත් වන බව සාමඤ්ඤඵල සූත්‍රයේ දැක්වේ

**2.ව්‍යාපාද** - සිතේ පවතින තරහව ( රත්වී බුබුළු නගන ජලය )

**3.ථීනමිද්ධ** - සිතෙහි කයෙහි නිදිමත බව,උදාසීන බව ( පාසි බැඳුණු ජලය )

**4.උද්ධච්ච කුක්කුච්ච** - සිතේ නොසන්සුන්බව,කළ නොකළ දේ පිළිබඳ පසුතැවිල්ල ( කැළඹුණු ජලය ) → සිර ගෙයක දුක් විඳින්නකු ලෙස...( සාමඤ්ඤඵල සූත්‍රය)

**5.විචිකිච්ඡාව** - බුද්ධාදී අටතැන්හි සැකය ( බොර ජලය ) → වනයක අතරමං වූවකු ලෙස... (සාමඤ්ඤඵල සූත්‍රය)

**ත්‍රිවිධ තෘෂ්ණාව**

කාම තණ්හා - පස්කම්සැප විඳීමට ඇති කැමැත්ත
භව තණ්හා - නැවත නැවතත් උපදිමින් පස්කම් සැප විඳීමට ඇති කැමැත්ත
විභව තණ්හා - නැවත උපතක් නැත,හැකිතාක් මෙලොවදීම සැප විඳිමියි යන ආශාව

ශ්‍රද්ධාවේ ප්‍රභේද 2කි
1.අමූලිකා ශ්‍ර. - පදනමකින් තොරය
2.ආකාරවතී ශ්‍ර. - කරුණු දැන ඇතිවන ශ්‍රද්ධාවයි
- තෙරුවන් පිළිබඳ කරුණු දැන ඇතිකරගන්නා පැහැදීම - අවෙච්චප්පසාදය / ආකාරවතී ශ්‍රද්ධාව

**පඤ්ච ඉන්ද්‍රිය - පඤ්ච කාම වස්තු**

චක්ඛු (ඇස) - රූප
සෝත (කන) - ශබ්ද
ඝාන (නාසය) - ගන්ධ
ජිව්හා (දිව) - රස
කාය (ශරීරය) - ස්පර්ශ

**පඤ්චස්කන්ධය**

රූප
වේදනා
සඤ්ඤා
සංඛාර
විඤ්ඤාණ

**පද්ම උපමාව අනුව ත්‍රිවිධ පුද්ගලයන්**

උත්තම පෞරුෂ ඇත්තන්
මධ්‍යම පෞරුෂ ඇත්තන්
අවම පෞරුෂ ඇත්තන්

ලෝකය - අනුසෝතගාමීය
බුදුදහම - පටිසෝතගාමීය

තුන් දොර - සිත, කය, වචනය

**තිදොරින් වන අකුසල කර්ම 10කි.**

සතුන් මැරීම, සොරකම, වැරදිකාම සේවනය } කය

බොරු කීම, කේලාම් කීම, පරුෂවචන කීම, හිස් වචන කීම } වචනය

දැඩි ලෝභය (අභිධ්‍යාව), තරහව (ව්‍යාපාදය), වැරදි දැක්ම (මිත්‍යාදෘෂ්ටිය) } සිත

**කර්මයේ ප්‍රභේද**

**විපාක දෙන කාලය අනුව**

දිට්ඨ ධම්මවේදනීය - මෙලොවදීම විපාක දේ
උපපජ්ජවේදනීය - ඊළග ආත්මයේදී විපාක දේ
අපරාපරියවේදනීය - දෙවන ආත්මයෙන් පසුව...
අහෝසි කර්ම - විපාක නොදී අහෝසි වේ

**කාර්යයය හෙවත් කෘත්‍ය අනුව**

ජනක කර්ම
උපත්ථම්භක කර්ම
උපපීඩක කර්ම
උපඝාතක කර්ම

**විපාක දෙන ආකාරය/පිළිවෙල අනුව**

ගරුක - බලසම්පන්න කුසලාකුසල කර්ම
ආසන්න - මරණාසන්න මොහොතේ කරන ලද හෝ සිහිකරන ලද කර්ම
ආචිණ්ණ - පුරුද්දක් ලෙස කරන ලද හෝ නිතර නිතර සිහිකරන ලද කර්ම
කටත්තා කර්ම - අසම්පූර්ණ කුසලාකුසල කර්ම

**කර්මයේ බලපෑම වෙනස්කරන සාධක (යහපත් කරන ලද සාධක)**

ගති සම්පත්ති -සැපවත් තැනක ඉපදීම
උපධි ස. - උසස් රූප ශෝභාවක් හිමිවීම
කාල ස. - සෞභාග්‍යවත් කාලයක ඉපදීම
ප්‍රයෝග ස. - ප්‍රඥාව හා උත්සාහය



සැකසුම - ඩී.එම්.එස්.එන්.හංසිකා

<u>භාවනාව</u> කොටස් 2කි :- සමථ, විදර්ශනා

භාවනාවට යොමු වන්නෙක් ඉටුකරගත යුතු පූර්ව අවශ්‍යතා 5කි.

1.කල්‍යාණ මිත්‍ර ආශ්‍රය
2.සිල්වත්බව
3.ධර්ම ශ්‍රවණය
4.වීර්යය
5.ප්‍රඥාව

***<u>විදර්ශනා භාවනාව (විපස්සනා, ත්‍රිලක්ෂණ, ප්‍රඥා)</u>***

- කෙලෙස් මුලිනුපුටා දමයි.
- චතුරාර්‍ය සත්‍ය අවබෝධකරගත හැකිය

***<u>සමථ භාවනාව (කම්මට්ඨාන,සමාධි,චිත්ත )</u>***

කෙලෙස්(නීවරණ) යටපත් කරයි
සිත එකඟ කරයි
පඤ්ච අභිඥා,අෂ්ට සමාපත්ති ලබාගත හැක

**<u>සමාධි භාවනාවට යොමුවන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග 3කි</u>**

I. ඉන්ද්‍රිය සංවරය
II. සති සම්පජඤ්ඤ(සියලු ක්‍රියාවල සිහියෙන් යුක්තවීම)
III. සන්තුට්ඨිතා (ලද දෙයින් සතුටු වීම)

*.සමථ භාවනාවටයොදාගත හැකි කමටහන් 40කි.
*.කමටහන් ලබා දීමේදී සලකාබලන පුද්ගල චරිත 6කි:-

| | |
|---|---|
| රාග | සද්ධා |
| දෝස | බුද්ධි |
| මෝහ | විතර්ක |

නිබද්ධ චාරිකා: අසරණ වූ පිරිස් සොයා වැඩම කොට අවශ්‍ය උපකාර කිරීම

***<u>ගිලනුන්ට උපකාර කළ අවස්ථා</u>***

පූතිගත්තිස්ස තෙරුන්ට, උදරාබාධයකින් පෙලුණු භික්ෂුවකට, මහා කාශ්‍යප හිමියන්ට, මුගලන් හිමියන්ට උපස්ථාන කිරීම

<u>අසරණයන්ට සරණවීම</u>

සෝපාක, රජ්ජුමාලා, ආලවක කුමාරයා, අසරණ ගොවියා, දරුවන් විසින් නොසලකාහැරි මහලු පියා, හදුවතිකා ඇතින්න

***<u>පුරිසදම්ම සාරථී ගුණය</u>***

අංගුලිමාල,නාලාගිරි ඇතා, ආලවක යකු, සුචිරෝම ඛරරෝම වැනි යක්ෂයින්

***<u>තාදී ගුණය(අටලෝ දහමින් කම්පා නොවීම)</u>***

වේරංජා නුවර වස් විසීම(12 වන වස)

බිම්බිසාර.අනේපිඬු සිටුතුමා,විශාකාව වැනි අයගේ ප්‍රශංසා,ආරාම පූජා ආදිය මැදහත්ව ඉවසීම

චිංචිමානවිකාව,සුන්දරී පරිබ්‍රාජිකාව වැනි අයගේ අපහාස ඉවසීම

**<u>පාරමිතා (බුද්ධ කාරක ධර්ම)</u>** - පාරමිතා පිරිය යුත්තේ තණ්හාව,මානය,මිත්‍යා දෘෂ්ටියෙන් තොරව හා කරුණාවෙන්, ප්‍රඥාවෙන් යුතුවය.

1.දාන - වෙස්සන්තර/සිවි/සස
2.සීල - සීල විමංසා
3.නෙක්ඛම්ම - මඛාදේව
4.ප්‍රඥා - උම්මග්ග
5.වීර්‍යය - වණ්ණුපථ
6.ඛන්ති(ඉවසීම) - ක්ෂාන්තිවාදී
7.සත්‍ය - වට්ටක
8.අධිෂ්ඨාන - තේමිය
9.මෙත්තා - මහාකපි,මසමානවක
10.උපේක්ඛා - ලෝමහංස

<u>ප්‍රඥාව දියුණු කරගන්නා ක්‍රම 3කි</u>

1.චින්තාමය - සිතීමෙන්
2.සුතමය - සවන් දීමෙන්, පොත් කියවීමෙන්
3.භාවනාමය

**<u>පූජා බුද්ධියෙන් දන් දීම</u> - තමන්ට වඩා උසස් ගුණධර්ම සහිත අයට දන් දීම**

**<u>අනුග්‍රහ බුද්ධියෙන් දන් දීම</u> - අසරණ වූවන්ට අනුකම්පාවෙන් , කරුණාවෙන් දන් දීම**

**<u>තෙවැදෑරුම් වීර්යය</u>**

1.ආරම්භ ධාතු - කාර්යය ආරම්භ කිරීමේදී...
2.නික්කම ධාතු - ඉදිරිපත්වීමේදී..
3.පරක්කම ධාතු - නිරතවීමේදී ඇතිකරගත යුතු වීර්යය

පාරමිතා ත්‍රිවිධාකාරය :

පාරමිතා - භෞතික වස්තු කැප කරමින්...
උප පාරමිතා - ශරීර අවයව කැප කරමින්...
පරමත්ථ පාරමිතා - ජීවිතය කැප කරමින් පාරමිතා සම්පූර්ණ කිරීම

තුන්තරා බෝධිය:
බුදු - පාරමිතා/උප පා./පරමත්ථ පා.
පසේබුදු - පාරමිතා/උප පා.
මහරහත් - පාරමිතා

<u>සීලය</u> :- කය, වචනය දෙකෙහි සංවර බව ( කයෙන් සිදුවන වැරදි 3න්, වචනයෙන් සිදුවන වැරදි 4න් වැළකීම හා නිවැරදි දිවිපැවැත්ම)

සිරිත් / සමාදාන / කළයුතු දේ

විරිත් / විරමණ / නොකළයුතු දේ

**<u>සිල් රැකීමේ ආනිසංස 5කි.</u>**

1.මහත්වූ භෝග සම්පත් අත්කර ගැනීම
2.කීර්තිය පැතිරීම
3.ඕනෑම පිරිසක් මැද නිර්භයව එළඹීමට හැකිවීම
4.සිහිමුලා නොවී කලුරිය කිරීම
5.මරණින් මතු සුගතියේ උපත ලැබීම

**<u>සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් භෝග විනාශයට හේතු 6කි.</u>**

1.මද්‍යසාර භාවිතය
2.අවේලාවන්හි මංමාවත්වල සැරිසැරීම
3.නැටුම් ගැයුම් වැයුම්වලට ලොල් බව
4.සූදුව
5.පව්ටු මිතුරු ඇසුර
6. අලසව කල් ගෙවීම



***සැකසුම - ඩී.එම්.එස්.එන්.හංසිකා***

# බප/කළු සාන්ත මරියා විද්‍යාලය, මග්ගොන
## බුද්ධ ධර්මය - කෙටි සටහන්

**දම්සක් පැවතුම් සූත්‍රය/ධම්මචක්කපවත්තන සූත්‍රය**

*. ඇසළ පොහෝ දිනක,බරණැස ඉසිපතනයේදී, පස්වග තවුසන්හට දේශනා කළ සේක

*. චතුරාර්‍ය සත්‍ය අන්තර්ගත වේ

1. **දුක්ඛ ආර්යය සත්‍ය - දුක**
සසර උපදින සියලු සත්ත්වයින්ට ඉපදීම(ජාති), වයසට යාම(ජරා), ලෙඩවීම(ව්‍යාධි), මරණය, ප්‍රියයන්ගෙන් වෙන්වීම, අප්‍රියයන් හා එක් වීම, කැමති දේ නොලැබීම යනාදී දුක්වලට මුහුණ දීමට සිදුවේ.
2. **දුක්ඛ සමුදය ආර්යය සත්‍යය - දුකට හේතුව**
සසර දුකට ප්‍රධාන හේතුව තෘෂ්ණාවයි.එය කාම තණ්හා,භව තණ්හා, විභව තණ්හා ලෙස තුන් ආකාර වේ.
3. **දුක්ඛ නිරෝධ ආර්යය සත්‍යය - දුක නැති කිරීම**
සසර දුකට හේතුව වන තෘෂ්ණාව නැති කිරීම
4. **දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්යය සත්‍යය - දුක නැති කිරීමේ මාර්ගය**

දුක තුන් ආකාරබව ධර්ම විවරණවල සඳහන් වේ.

1.දුක්ඛ දුක්ඛතා - සාමාන්‍ය දුක්
2.විපරිණාම දුක්ඛතා - වෙනස්වීමේ දුක
3.සංඛාර දුක්ඛතා - ඇතිවීම නැතිවීම නිසා හටගන්නාදුක

දුකින් මිදීමේ මාර්ගය / මධ්‍යම ප්‍රතිපදාව / ආර්ය අෂ්ඨාංගික මාර්ගය :

| | | | |
|---|---|---|---|
| ප්‍රඥා | I. සම්මා දිට්ඨි | : කුසලය හා අකුසලය පිළිබඳ නිවැරදි දැක්ම |
| | II. සම්මා සංකප්ප | : පස්කම් සැපතින් නික්මීමේ,ද්වේශ නොකිරීමේ හා හිංසා නොකිරීමේ සංකල්පනාව |
| සීල | III. සම්මා වාචා | : බොරු කීම, කේලාම් කීම, හිස් වචන කීම, රළු වචන කීම යන වචනයෙන් සිදුවන අකුසලයන්ගෙන් වෙන්වීම |
| | IV. සම්මා කම්මන්ත | : ප්‍රාණඝාතය, සොරකම, වැරදි කාම සේවනයෙන් වැලකීම |
| | V. සම්මා ආජීව | : නිවැරදි ජීවන වෘත්තීන්හි නිරත වීම |
| සමාධි | VI. සම්මා වායාම | : නුපන් අකුසල් නොඉපදවීම, උපන් අකුසල් නැති කිරීම, නුපන් කුසල් ඉපිදවීම, උපන් කුසල් වැඩි දියුණු කිරීමට දරන උත්සාහය |
| | VII. සම්මා සති | : සතර සතිපට්ඨානයෙන් යුක්ත පැවැත්ම/ නිවැරදි සිහිය |
| | VIII. සම්මා සමාධි | : ධ්‍යාන වැඩීමෙන් සිත පිරිසිදු කිරීම හා එකඟ කිරීම/ නිවැරදි මානසික එකඟබව |

**නෙක්ඛම්ම සංකප්ප**
**අව්‍යාපාද සංකප්ප**
**අවිහිංසා සංකප්ප**

**නොකළ යුතු වෙළඳාම් 5කි**

**අවි ආයුධ වෙ.**
**සත්ත්ව වෙ.**
**මස්මාංශ වෙ.**
**මත්ද්‍රව්‍ය වෙ.**
**වසවිස වෙ.**

**සතර සතිපට්ඨානය**

**කායානුපස්සනාව**
**වේදනානුපස්සනාව**
**චිත්තානුපස්සනාව**
**ධම්මානුපස්සනාව**

විමුක්තිය සෙවීම උදෙසා භාරතීය සමාජය අනුගමනය කළ ,බුදුරදුන් ප්‍රතික්ෂේප කළ අන්තගාමී පිළිවෙත් 2 :
අත්තකිලමථානුයෝගය(ශරීරයට දැඩි දුක් දීම) , කාමසුඛල්ලිකානුයෝගය(ශරීරයට අධික සැපදීම)

**ගිරිමානන්ද සූත්‍රය** :- ගිරිමානන්ද හිමියන්ට දේශනා කළ සේක

*. රෝග දෙයාකාරය : කායික රෝග , මානසික රෝග
*. කායික රෝග රාශියක් මෙහි අන්තර්ගතවේ
*. රෝග වැළඳීමට හේතුවන කරුණු 8ක් සඳහන් වේ →

1.පිත් ධාතුව කිපීමෙන්
2.සෙම් ධාතුව කිපීමෙන්
3.වාතය කිපීමෙන්
4.වා,පිත්,සෙම් යන තුන්දොස් කිපීමෙන්
5.ඍතු විපර්‍යාස නිසා
6.වැරදි කායික ක්‍රියාකාරකම් නිසා
7.අනුන්ගේ උපක්‍රම නිසා
8.කර්ම විපාක අනුව

**සිඟාලෝවාද සූත්‍රය** :- සදිසාවන්ට නමස්කාර කරමින් සිටි සිඟාල නම් තරුණයාට දේශනා කළ සේක

*. සදිසා නමස්කාරය අන්තර්ගතවේ
*. යුතුකම් 61ක් ඇතුළත් වේ
*.භෝග විනාශයට හේතු 6ක් ද අන්තර්ගත වේ

1.නැගෙනහිර - දෙමව්පියන් හා දරුවන්
2.දකුණ - ගුරුවරුන් හා ශිෂ්‍යයින්
3.බටහිර - ස්වාමියා හා බිරිඳ
4.උතුර - හිතමිතුරන්
5.යට දිසාව - සේව්‍යයා හා සේවකයන්
6.උඩ දිසාව - ගිහියන් හා පැවිදි උතුමන්

**ව්‍යග්ඝපජ්ජ සූත්‍රය** :- කක්කරපත්ත ගමේදී ව්‍යග්ඝපජ්ජ වංශික "දීඝජානු" කෝලිය පුත්‍රයාට දේශනා කළ සේක

*. මෙලොව දියුණුවට හේතුවන කරුණු 4ක්ද පරලොව දියුණුවට හේතුවන කරුණු 4ක් ද ඇතුළත් වේ

| | |
|---|---|
| 1.උට්ඨාන සම්පදා | :උත්සාහයෙන්,දැතේ මහන්සියෙන්,දහඩිය හෙලා,ධාර්මිකව ධනය ඉපයිය යුතුය |
| 2.ආරක්ඛ සම්පදා | : ධාර්මිකව උපයාගත් ධනය රැකගත යුතුය |
| 3.කල්‍යාණ මිත්තතා | : සද්ධා,සීල,ත්‍යාග,ප්‍රඥා යනාදී උසස් ගුණධර්ම සහිත මිතුරන් ඇසුරු කිරීම |
| 4.සමජීවිකතා | : අය වැය මනාව පාලනය කිරීම |

**ධාර්මික රැකියා 6 කි**

කෘෂිකර්මය
වෙළෙඳාම
ගවයන් රැක බලා ගැනීම
ආරක්ෂක සේවාව
රාජ්‍ය සේවය
වෙනත් ශිල්ප කර්මාන්ත

**අධාර්මික වෙළඳාම් ක්‍රම 3 :**
**තුලා කූට(හොරට කිරීම), මාන කූට (හොරට මැනීම) . කංස කූට (බාල දේ විකිණීම)**

**ධනය විනාශ විය හැකි ක්‍රම 4කි**

1.රජයට අයත් වීම 2.ගින්නෙන්,ජලයෙන් විනාශ වීම 3.සොරුන් පැහැර ගැනීම 4.ප්‍රිය නොකරන්නන්ට අයත්වීම



*සැකසුම - ඩී.එම්.එස්.එන්.හංසිකා*

# බප/කළු සාන්ත මරියා විද්‍යාලය, මග්ගොන

## *බුද්ධ ධර්මය - කෙටි සටහන්*

**මහා මංගල සූත්‍රය** : සැවැත් නුවර ජේතවනාරාමයේදී,මංගල කරුණු කවරේදැයි විමසීමට පැමිණි දෙවියන් හට දේශනා කළ සේක
*. කරුණු 38ක් අන්තර්ගතය

1. අනුවණයින් ඇසුරු නොකිරීම
2. නුවණැත්තන් ඇසුරු කිරීම
3. පිදිය යුත්තන් පිදීම
4. සුදුසු පෙදෙසක වාසය කිරීම
5. පෙර කරන ලද පින් ඇති බව
6. සීලයාදී ගුණ ධර්මයන්හි පිහිටීම
7. බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව
8. ශිල්ප ශාස්ත්‍ර ප්‍රගුණ බව
9. විනය ගරුක බව
10. හික්මීම
11. ප්‍රිය වචන කතා කිරීම
12. මව්පියන්ට සැළකීම
13. අඹුදරුවන්ට සංග්‍රහ කිරීම
14. නිවැරදි කාය කර්මවල නියැලීම
15. දන් දීම
16. ධර්මානුකූලව හැසිරීම
17. නෑයන්ට සංග්‍රහ කිරීම
18. නිවැරදි ජීවන වෘත්තියක යෙදීම
19. පාපයෙහි නොඇලීම
20. මත්පැනින් වැළකීම
21. කුසල් දහම්හි පමා නොවීම
22. ගරුකළ යුත්තන්ට ගරු කිරීම
23. යටහත් පහත් බව
24. ලද දෙයින් සතුටු වීම
25. කළගුණ සැලකීම
26. සුදුසු කාලයෙහි දහම් ඇසීම
27. ඉවසීම
28. උත්තමයන්ගේ අවවාද පිළිගැනීම
29. ශ්‍රමණයන් වහන්සේලා දැකීම
30. සුදුසු කල ධර්ම සාකච්ඡා කිරීම
31. තපස
32. බ්‍රහ්ම චර්යාව
33. ආර්ය සත්‍ය දැකීම
34. නිවන් අවබෝධ කරගැනීම
35. අටලෝ දහමින් කම්පා නොවීම
36. ශෝක රහිත බව
37. කෙලෙස් නැති බව
38. බිය නැති බව

**පංච බලි**

1.අත්ථි බලි - ආගන්තුක සත්කාරය
2.ඤාති බලි - ඤාතීන්ට සැළකීම
3.පුබ්බපේත බලි - මියගිය ඤාතීන්ට යුතුකම් ඉටු කිරීම
4. රාජ බලි - රජයට බදු ගෙවීම
5. දේවතා බලි - දෙවියන්ට පින් දීම

**පරාභව සූත්‍රය** : පුද්ගලයාගේ පිරිහීමට හේතුවන කරුණු විමසූ දෙවියකු හට දේශනා කළ සේක

*. කරුණු 18ක් (ගාථා 12ක් තුළ) ඇතුළත් වේ.
1. ධර්මයට අකමැති වීම
2. අසත්පුරුෂයන්ට ප්‍රිය වීම
3. සත්පුරුෂයන්ට ප්‍රිය නොවීම
4. අසත්පුරුෂ ධර්මයට ප්‍රිය වීම
5. නිතර නිදන සුලු බව
6. කතාවෙන් දවස ගෙවීම
7. උත්සාහයෙන් තොර වීම
8. අලසකම
9. ක්‍රෝධ කරන බව
10. හැකියාව තිබියදීත් මහලු මව්පියන්ට නොසැලකීම
11. බමුණන්, පැවිද්දන්, තවුසන් බොරුවෙන් රැවටීම
12. බොහෝ ධනය, ආහාර ඇතත් තනිව භුක්ති විඳීම
13. ජාතිය, ධනය පිලිබඳ මානයෙන් තම නෑයන් පහත් කොට සැලකීම
14. සුරාවට,සූදුවට, ස්ත්‍රීන්ට ලොල්ව ධනය විනාශ කිරීම
15. පර අඹුවන් කරා යාම
16. තමාට වඩා ලාබාල තරුණියක් විවාහ කරගෙන, ඇය රැකීමට වෙහෙසීම
17. රසයට ගිජුවූ තැනැත්තකු ප්‍රධානියෙකු වීම
18. උසස් කුලයක උපන් ,ධනයෙන් හීන , වස්තු තණ්හාව ඇති අයකු රජකම පැතීම

**චූල්ලකම්මවිභංග සූත්‍රය** : තෝදෙය්‍යා පුත්‍ර සුභ මානවකයාට දේශනා කරන ලදී
*. කර්මය අනුව පුද්ගලයන් අතර විසමතා 14 ක් දක්නට ලැබෙන ආකාරය මෙහි සඳහන් වේ

1. සතුන් මරන්නා - අල්පායුෂ වේ
2. සතුන් නොමරන්නා - දීර්ඝායුෂ විඳී
3. සතුන්ට හිංසාකරන්නා - ආබාධ සහිතව උපදී
4. සතුන්ට හිංසා නොකරන්නා - නිරෝගීව උපදී
5. ද්වේශයෙන් සිටින්නා - විරූපීව උපදී
6. ද්වේශ නොකරන්නා - රූමත්ව උපදී
7. අන් අයට ඊර්ෂ්‍යා කරන්නා - අල්පේශාක්‍ය වේ
8. ඊර්ෂ්‍යා නොකරන්නා - මහේශාක්‍ය වේ
9. දන් නොදෙන්නා - දුප්පත්ව උපදී
10. දන් දෙන්නා - පොහොසත්ව උපදී
11. අධික මානයෙන්යුතු අය- පහත් කුලවල උපදී
12. මානයෙන් තොර අය - උසස් කුලවල උපදී
13. කුසල් අකුසල් පිළිබඳව නොවිමසන්නා - ප්‍රඥාව අඩුව උපදී
14. කුසල් අකුසල් (ධර්මය)විමසන්නා - ප්‍රඥාවන්ත වේ

**කාලාම සූත්‍රය** : කේසපුත්ත වාසී කාලාම වැසියන්ට දේශනා කළ සේක

යමක් පිළිගැනීමේදී එකහෙලා නොපිළිගත යුතු කරුණු 10කි

1. **ආරංචියකින්**
2. **පරම්පරාවෙන් පැවතෙන නිසා**
3. **කටකතා මගින්**
4. **ඉගැන්වීම සමග ගැලපෙන නිසා**
5. **තර්කානුකූල නිසා**
6. **න්‍යායානුකූල නිසා**
7. **මතුපිට ස්වරූපය අනුව**
8. **තම දැක්ම අනුව සැසඳෙන නිසා**
9. **සුදුසු බව පෙනෙන නිසා**
10. **ගුරුවරයා පවසන නිසා.....නොපිළිගත යුතුය**

<u>යමක් පිළිගැනීමේදී සලකා බැලිය යුතු කරුණු 4කි</u>

යම් ක්‍රියාවක්,
1. කුසල්ද අකුසල්ද
2. නිවැරදිද වැරදිද
3. නුවණැත්තන් ගරහයිද පසසයිද
4. අනුගමනය කරන්නාට යහපතක්වේද අයහපතක්වේද.......

**අණන සූත්‍රය** : අනේපිඬු සිටුතුමා හට දේශනා කල සේක
*. ගිහියන් විසින් උපදවාගත යුතු සැප 4ක් (චතුර්විධ සැප) අන්තර්ගතය

1. අත්ථි සුඛය :උත්සහයෙන්,දැතේ මහන්සියෙන්,දහඩිය හෙලා, ධාර්මිකව උපයාගත් ධනයක් ඇත යන සතුට
2. භෝග සුඛය :ධාර්මිකව උපයාගත් ධනය පරිභෝග කිරීමෙන් ලබන සතුට
3. අණන සුඛය : කිසිවකුට ණය නැතැයි යන සතුට
4. අනවජ්ජ සුඛය : නිවැරදි කාය, වචී, මනෝ කර්මයෙන් යුක්ත වෙමියි යන සතුට

**හද්දාලි සූත්‍රය** : ආහාරයෙහි ප්‍රමාණය දැන අනුභව කිරීම (ආහාරෙ මත්තඤ්ඤුතා) නිසා ලැබෙන ප්‍රතිඵල 5කි.
1.රෝගාබාධ අඩුවීම
2. නිදුක් බව
3. සැහැල්ලු පැවැත්ම
4. කාය බලය
5. සුවපහසු පැවැත්ම

**පත්තකම්ම සූත්‍රය** : අනේපිඬු සිටුතුමා හට දේශනා කළ සේක

*. උත්සාහයෙන්, දැතේ මහන්සියෙන්, දහඩිය හෙලා ධාර්මිකව උපයන ධනය පරිභෝග කළ යුතු ආකාර 4ක් ඇතුළත් වේ.
1.තමාගේද, මව්පියන්ගේද, අඹු දරුවන්ගේද, සේවකයන්ගේද සැපත හා යහපත වෙනුවෙන් යෙදවීම
2. උත්සාහයෙන්, දැතේ මහන්සියෙන්, දහඩිය හෙලා ධාර්මිකව උපයන ධනය විනාශ වීමට නොදී රැක ගත යුතුය (ගින්නෙන්,ජලයෙන්,සොරුන්ගෙන්,...)
3.පංච බලි නම් යුතුකම් ඉටුකළ යුතුය
4. ධාර්මිකව ඉපයූ ධනයෙන් පැවිදි උතුමන්ට දානාදියෙන් සංග්‍රහ කළ යුතුය



*සැකසුම - ඩී.එම්.එස්.එන්.හංසිකා*

# බප/කළු සාන්ත මරියා විද්‍යාලය, මග්ගොන

# බුද්ධ ධර්මය - කෙටි සටහන්

## බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම

1. දස සක්විතිවත්
2. සප්ත අපරිහානීය ධර්ම
3. දස රාජ ධර්මය
4. සතර අගතියෙන් තොර වීම
5. සිව් බඹ විහරණ
6. සතර සංග්‍රහ වස්තු
7. පංචසීල ප්‍රතිපත්තිය

## දස රාජ ධර්මය

1. දානය - රට වැසියාගේ ආර්ථික සුරක්ෂිතතාව උදෙසා ප්‍රාග්ධනය / යටිතල පහසුකම් සැපයීම
2. සීලය - කායික හා වාචසික සංවරයෙන් යුක්ත වීම
3. පරිත්‍යාගය - රටවැසියාගේ යහපත සඳහා තම කාලය, ශ්‍රමය, ධනය, සුවපහසුව කැප කිරීම
4. ඍජු බව - සතර අගතියෙන් තොරව සාධාරණව, අවංකව ක්‍රියා කිරීම
5. මෘදු බව - මොලොක් වූ හදවතින් ජනතාවගේ දුක හැඳින ක්‍රියා කිරීම
6. තපස - පසිඳුරන් පිනවීමට ගිජු නොවීම
7. අක්‍රෝධය - ක්‍රෝධයෙන්, වෛරයෙන් තොර වීම
8. අවිහිංසාව - හිංසාවෙන් තොරව රට පාලනය කිරීම
9. ඉවසීම - දුරදිග බලා ඉවසිලිවන්තව ක්‍රියා කිරීම
10. අවිරෝධතාව - විවිධ මත දරන්නන් සමග නොගැටී, මධ්‍යස්ථව ක්‍රියා කිරීම

## දස සක්විතිවත්

- ✓ දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ මෙම කරුණු අන්තර්ගත වේ
- ✓ එහි සඳහන් ප්‍රවාදයට අනුව දල්හනේමි නම් වූ දැහැමි රජු තම පුත්‍රයාට මේ කරුණු පිළිබඳව පවසා ඇත

1. අඹු දරුවන් ඇතුළු රජ පවුලේ පිරිසට
2. රට රකින බළ සෙනගට
3. රාජ්‍ය සේවයේ නියුතු ක්ෂත්‍රීය පිරිසට
4. කෘෂිකර්මය ආදී නිෂ්පාදන කටයුතුවල යෙදෙන බ්‍රාහ්මණ ගෘහපතීන්ට
5. කුඩාගම්වල වැසියන්ට හා ජනපද වාසීන්ට
6. ජනයාගේ සදාචාර සංවර්ධනයට මගපෙන්වන ශ්‍රමණ බ්‍රාහ්මණ පිරිසට
7. තිරිසනුන්ට හා පක්ෂීන්ට

} ධාර්මික රැකවරණය සැලසීම

8. රටේ අධාර්මික ක්‍රියා ඇති නොවන සේ ක්‍රියා කිරීම
9. දිළිඳු ජනයාට ධනය දීම
10. සිල්වත්, ගුණවත්, වියත් මහණ බමුණන්ගේ අවවාද ලබා ගනිමින් රට පාලනය කිරීම

දස සක්විතිවත්වල අන්තර්ගත වැදගත් කරුණු

I. ධාර්මිකව රාජ්‍ය පාලනය
II. මිනිස් තිරිසන් සෑම කොටසකටම ආරක්ෂාව ලබා දීම
III. නීති විරෝධී අධාර්මික ක්‍රියා වැළැක්වීම
IV. සුදුසු පුද්ගලයන්ගෙන් උපදෙස් ලබා ගැනීම

## සප්ත අපරිහානීය ධර්ම : බුදුරජාණන් වහන්සේ විසින් වජ්ජි රජදරුවන්ට ඉගැන්වූ පාලන ක්‍රමයකි

1. නිතර රැස්වීම
2. සමගිව රැස්වී,සමගිව සාකච්ඡා කොට සමගිව විසිර යාම
3. පෙර නොපැනවූ නීති නොපැනවීම, පනවන ලද නීති ආරක්ෂා කිරීම
4. වැඩිහිටියන්ට ගරු කිරීම
5. කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම
6. වජ්ජි රාජ්‍ය තුළ හා පිටත පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම
7. තම රාජ්‍යට පැමිණි හා පැමිණෙන පූජනීය උතුමන්ට පහසුකම් සැලසීම

බුද්ධකාලීන භාරතයේ පැවති පාලන ක්‍රම 2 කි

1. රාජාණ්ඩු ක්‍රමය
2. සමූහාණ්ඩු පාලනය / ගණතන්ත්‍ර පාලනය

උදා: වජ්ජි රජ දරුවන්

සප්ත අපරිහානීය ධර්ම වල ඇතුළත්, දස සක්විතිවත්වල අන්තර්ගත නොවන වැදගත් ප්‍රතිපත්ති කීපයකි

I. නීතිය ආරක්ෂා කළ යුතුය
II. රාජ්‍ය පාලකයින් සමගිව ක්‍රියා කළ යුතුය
III. කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම
IV. පූජනීය ස්ථාන රැකගැනීම හා පූජනීය උතුමන්ට පහසුකම් සැලසීම

## ❖ සතර සංග්‍රහ වස්තු

I. දානය - …
II. ප්‍රිය වචනය - වචනයෙන් සිදුවන වැරදි 4න් තොරව කතාබස් කිරීම
III. අර්ථචර්යාව - අන් අයගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීම
IV. සමානාත්මතාව - ජාති, ආගම්, කුල භේද නොසලකා සම සිතින් කටයුතු කිරීම

## ❖ සිව් බඹ විහරණ

I. මෙත්තා - මෛත්‍රිය / හිතවත්කම
II. කරුණා සඳහා - දුකට පත් ජනයා දුකින් මුදවා ගැනීම ඇතිවන අනුකම්පාව
III. මුදිතා පත්වීම - අන් අයගේ දියුණුව දැක සතුටට
IV. උපේක්ඛා - මැදහත්බව

චක්කවත්ති සීහනාද සූත්‍රය :- දිළින්දන්ට ධනෝපායන මාර්ග නොමැති වීම නිසා සමාජ ප්‍රශ්න ඇතිවන ආකාරය පටිච්චසමුප්පාද න්‍යායට අනුව පෙන්වා දී ඇත

මහා නිදාන සූත්‍රය :- තණ්හාව මුල්කොටගෙන සමාජයේ කලකෝලාහල ඇතිවන ආකාරය පටිච්චසමුප්පාද න්‍යායට අනුව පෙන්වා දී ඇත

අග්ගිවච්චගොත්ත සූත්‍රය :- දර,ගිනි යන භෞතික වස්තූන් අතර ඇති හේතු ඵල සම්බන්ධය පැහැදිලි කර තිබේ

## සිදුහත් බෝසතුන් මුහුණ දුන් අභියෝග

- ✓ ශිල්ප හැදෑරීම
- ✓ විවාහය
- ✓ සතර පෙර නිමිති දැකීම
- ✓ රාහුල කුමරුගේ උපත
- ✓ නිබ්බුත පද ඇසීම
- ✓ ගිහිගෙය හැර යාම
- ✓ දුෂ්කර ක්‍රියා සමය

## බුදුරජාණන් වහන්සේ මුහුණ දුන් අභියෝග

- ✓ දස මාර සේනාව පරාජය කිරීම
- ✓ තණ්හා,රතී, රගා යන මාර දූවරුන්ට මුහුණ දීම
- ✓ අනිමිස ලෝචන පූජාව
- ✓ ලෝකයාට ධර්මය දේශනා කිරීම
- ✓ තනතුරු ප්‍රදානය
- ✓ වේරංජා පුරයේ වස් විසීම
- ✓ ධර්මධර හා විනයධර භික්ෂූන් අතර කලහය

## පාසල් සිසුන්ගේ දියුණුවට බාධා කරන මාර බලවේග

- ✓ කුසගින්න
- ✓ අලසබව
- ✓ දඩබ්බර ගතිය
- ✓ ඊර්ෂ්‍යාව
- ✓ පළිගැනීම
- ✓ තරුණ මදය

## ධම්මපදය / බෞද්ධයාගේ අත්පොත

- ✓ සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් වේ
- ✓ වග්ග 26කි
- ✓ ගාථා 423කි
- ✓ නිදාන කථා 299කි



සැකසුම - ඩී.එම්.එස්.එන්.හංසිකා

# බප/කළු සාන්ත මරියා විද්‍යාලය, මග්ගොන
## බුද්ධ ධර්මය - කෙටි සටහන්

රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං : රාහුලෙක් උපන්නා බන්ධනයක් ඇතිවුනා

යථාභූතඤාණ දස්සනය : ඇත්ත ඇති සැටියෙන් දැකීම

භාවේති කුසල ධම්මේ ආසේවති වඩ්ඩේති ඒතායතානි භාවනා
කුසල් දම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි

අනිච්චාවත සංඛාරා උප්පාද වයධම්මිනෝ : ඇතිවී නැතිවී යන බැවින් සංස්කාර ඒකාන්ත වශයෙන්ම අනිත්‍යය (පරිනිබ්බාන සූත්‍රය)

චිත්තං සමේතීති සමථෝ : සිත සන්සුන් කරන්නේ සමථයයි

විසේසේන පස්සතීති විපස්සනා : විශේෂයෙන් දැකීම විපස්සනාවයි

සමග්ගා හෝථ මා විවදථ : සමගි වන්න විවාද නොකරන්න

හේතුං පටිච්ච සම්භූතං - හේතු භගා නිරුජ්ජති :
හේතු නිසා හටගත් දෑ හේතු නැති වනවිට නැති වී යයි

සමවායෝ එව සාධු : සමගිය ම යහපති

චේතනාහං භික්ඛවේ කම්මං වදාමි - මහණෙනි, මම චේතනාවම කර්මය යැයි කියමි
චේතයිත්වා කම්මං කරෝති,කායේන වාචාය මනසා - සිතින් සිතා,කයෙන් වචනයෙන් මනසින් කර්ම සිදුකරයි

දූරංගමං ඒකචරං - දූරගමන් යන, තනිව හැසිරෙන
අසරීරං ගුහාසයං - ශරීරයක් නැති, ගුහාවක වෙසෙන
යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති - මේ සිත දමනය කරගන්නා තැනැත්තා
මොක්ඛන්ති මාර බන්ධනා - මාරයාගේ බැම්මෙන් මිදෙයි

විනයෝ නාම සාසනස්ස ආයු - විනය,සසුනේ ආයුෂයයි

ආරෝග්‍යා පරමා ලාභා - නිරෝගීබව පරම ලාභයයි

යෝනිසෝ මනසිකාරය - විමසාබලා කටයුතු කිරීම

ඉමස්මිං සති ඉදං හෝති - මෙය ඇති කල්හි මෙය ඇතිවේ
ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති - මෙය උපන් කල මෙය උපදී
ඉමස්මිං අසති ඉදං න හෝති - මෙය නැති කල්හි මෙය ඇති නොවේ
ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති - මෙය නැති වීමෙන් මෙය නැති වේ

"අග්ගෝ හමස්මි ලෝකස්ස..." - උපත ලද මොහොතේ කල සිංහනාදය
"අනේක ජාති සංසාරං..." - බුදු වූ පසු පැවසූ උදාන වාක්‍යය

"හන්දදානි භික්ඛවේ - ආමන්තයාමි වෝ
වයධම්මා සංඛාරා - අප්පමාදේන සම්පාදේථ" } අවසන් බුද්ධ වචනය

මහණෙනි,කරුණාවෙන් ඔබ අමතමි.සියලු සංස්කාර නැසෙන සුළුය.නොපමාව දුකින් මිදීම පිණිස කුසල ධර්ම සම්පූරණ කරන්න

"උට්ඨානවතෝ සතිමතෝ..." ධම්මපද ගාථාවේ සඳහන් දියුණුවන පුද්ගලයකු තුළ තිබිය යුතු ගුණාංග 7 කි.

1. උට්ඨානවතෝ - උත්සාහවන්තබව
2. සතිමතෝ - සිහියෙන් යුක්ත වීම
3. සුචිකම්ම - කයෙන්,වචනයෙන් ,සිතෙන් නිවැරදි දේ කිරීම
4. නිසම්මකාරී - නුවණින් පිරික්සා බලා කටයුතු කිරීම
5. සඤ්ඤත - හික්මීම
6. ධම්මජීවී - දැහැමිව ජීවත්වීම
7. අප්පමත්ත - ප්‍රමාද නොවී ක්‍රියා කිරීම

පරචිත්ත විජානන ඥානය :අන් අයගේ සිත දැන ගැනීමේ නුවණ
ආසවක්ඛය ඥානය : සියලු කෙලෙස් නැති කිරීමේ නුවණ

**<u>දෝනපාක සූත්‍රය</u>** - ප්‍රමාණය දැන ආහාර ගන්නාගේ ආයුෂ වැඩෙන බව සඳහන් වේ (ප්‍රමාණය ඉක්මවා ආහාරගෙන අපහසුවෙන් සිටි කොසොල් රජුට බුදුරදුන් අවවාද කළ සේක)

**<u>චූල්ලහත්ථි පදෝපම සූත්‍රය</u>** - ඇත් අඩි උපමාව: සමීප හේතු පමණක් සලකා බලා ත්‍රිවිධ රත්නය පිළිබඳ නිගමනවලට නොඑලඹිය යුතු බව සඳහන් වේ

ජිඝච්ඡා පරමා රෝගා : කුසගින්න බලවත්ම රෝගයයි

**<u>වාසෙට්ඨ සූත්‍රය</u>** - වෙනත් සත්ත්ව වර්ගයා අතර ජීව විද්‍යාත්මක වෙනස්කම් ඇතත් මිනිස් වර්ගයා අතර එවැනි වෙනස්කම් නොමැති බව සඳහන් වේ

**<u>සම්මා දිට්ඨිය :</u>** නිවැරදි දැක්ම

සච්චවිභංග සූත්‍රය - සම්මා දිට්ඨිය යනු චතුරාර්‍ය සත්‍යය පිළිබඳ ඥානයයි

**<u>සම්මා දිට්ඨිය</u>** පස් ආකාර බව අටුවාවල සඳහන් වේ

1. කම්මස්සකතා ස.දි. - තමන් කරන ක්‍රියාවල විපාක ලැබෙන බව දැකීම
2. ධ්‍යාන ස.දි. - ලෞකික ධ්‍යාන උපදවාගත් පසු සිල් රැකීමේ ප්‍රතිලාභ නිවැරදිව දැන ගැනීම
3. විදර්ශනා ස.දි. - ත්‍රිලක්ෂණය දැකීම
4. මාර්ග ස.දි. - සිව්සස් අවබෝධ කරගන්නා දැක්ම
5. ඵල ස.දි. - සෝවාන් ආදී ඵල සිත්වල ඇතිවන දැක්ම

1,2,3 :- ලෞකික ආර්‍ය අෂ්ටාංගික මාර්ගයට අයත් වේ
4,5 :- ලෝකෝත්තර පුද්ගලයන්ගේ සිත්වලට සීමා වේ

**<u>බුදු ගුණ රාශි 9කි</u>**

අරහං - රහසින්වත් පව් නොකළ නිසා
සියලු කෙලෙස් දුරු කළ නිසා
සියලු පූජාවන් ලැබීමට සුදුසු නිසා
සුගත - ආර්‍ය මාර්ගය අනුගමනය කළ නිසා
නිර්වාණයට සැපත් වූ නිසා
යහපත් වචන ඇති නිසා
පුරිස ධම්ම සාරථී - නොහික්මුණු පිරිස් හික්මවා ගැනීමේ හැකියාව

**<u>දහම් ගුණ 6කි</u>**

සන්දිට්ඨික - තමා විසින්ම පිළිපැද මෙලොවදීම ප්‍රතිඵල දැක ගත හැකි බැවින්

**<u>සංඝ රත්නයේ ගුණ 9කි</u>**

සුපටිපන්න - සංඝ රත්නය මනාවූ පිළිවෙත් පුරන නිසා

(තෙරුවනෙහි සූවිසි ගුණය යනු ; 9+6+9 =24)



*සැකසුම - ඩී.එම්.එස්.එන්.හංසිකා*

# බප/කළු සාන්ත මරියා විද්‍යාලය, මග්ගොන

## *බුද්ධ ධර්මය - කෙටි සටහන්*

**<u>අනුරාධපුර යුගය</u>**

සීහලට්ඨ කථා(හෙළ අටුවා) - පැරණිම බෞද්ධ කෘති
සිඛවළඳ
සිඛවළඳවිනිස
ධම්පියා අටුවා ගැටපදය
*. සීගිරියේ පද්‍යා නිර්මාණ මේ යුගයට අයත්ය

**<u>*පොළොන්නරු යුගය*</u>**

අමාවතුර (පුරිසධම්ම සාරථී ගුණය) - ගුරුළුගෝමී පඬිතුමා
ධර්මප්‍රදීපිකාව (පාලි බෝධිවංශය පදනම් වී ඇත) - ගුරුළුගෝමී පඬිතුමා
බුත්සරණ (නව අරහාදී බුදු ගුණ) - විද්‍යා චක්‍රවර්තී පඬිතුමා
මුවදෙව්දාවත (මඛාදේව ජාතකය) } කාව්‍ය ග්‍රන්ථ
සසදාවත (සස ජාතකය)

**<u>*දඹදෙණි යුගය*</u>**

පූජාවලිය(අරහං බුදු ගුණය) - බුද්ධ පුත්‍ර හිමි
සද්ධර්මරත්නාවලිය - ධර්මසේන හිමි
කව්සිළුමිණ(කුස ජාතකය) - 2වන පරාක්‍රමබාහුරජු
දහම් සරණ, සඟ සරණ
*. සිදත් සඟරාව, පියුම්මල් නැමැති නිසණ්ඩුව එළු සඳැස් ලකුණ

**<u>*ගම්පොළ යුගය*</u>**

මයුර සංදේශය (5වන බුවනෙකබාහු රජ සමයේදී)
තිසර සංදේශය
නිකායසංග්‍රහය හෙවත් ශාසනාවතාරය - ද්විතීය ධර්මකීර්ති හිමි
එළිඅත්තනගලුවංසය, සද්ධර්මාලංකාරය

**<u>*කුරුණෑගල යුගය*</u>**

පන්සිය පනස් ජාතකය (ජාතක කථා 547)
සිංහල බෝධි වංශය (ජය ශ්‍රී මහා බෝධියේ ඉතිහාසය)
ථූපවංශය (රුවන්වැලි සෑයේ විස්තරය) - විද්‍යා චක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිත

**<u>*කෝට්ටේ යුගය*</u>**

(සැළලිහිණි සංදේශය, පරෙවි සංදේශය, කාව්‍යශේඛරය, පඤ්චිකා ප්‍රදීපය, බුද්ධිප්පසාදිනිය) -තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

ලෝවැඩ සඟරාව, බුදුගුණාලංකාරය - වීදාගම මෛත්‍රීය හිමි
ගුත්තිල කාව්‍ය - වැත්තෑවේ හිමි
කෝකිල සංදේශය, ගිරා සංදේශය, හංස සංදේශය, දහම් ගැට මාලාව, චූලබෝධි වංශය, පැරකුම්බා සිරිත

**<u>ස්තූප</u>** : වර්ග 6 කි

- ඝණ්ඨාකාර -ථූපාරාමය, මහියංගන ස්තූපය
- ඝටාකාර(කළයක හැඩය)- කතරගම කිරිවෙහෙර(පෙර පැවති හැඩය)
- බුබ්බුලාකාර - රුවන්වැලිසෑය, අභයගිරිය
- ධාන්‍යාකාර - කැළණිය
- පද්මාකාර - දැදිගම කොටවෙහෙර
- ආමලාකාර(නෙල්ලි ගෙඩියක හැඩය)

**<u>ස්තූපයක අංග</u>**:

| | |
|---|---|
| 1.තුන්මහල් පේසාව | 4. දේවතා කොටුව |
| 2.ගර්භය | 5. කොත් කැරැල්ල |
| 3.හතරැස් කොටුව | 6. චූඩාමාණික්‍ය |

**<u>චෛත්‍යඝර/වටදාගෙය</u>** : ස්තූප වටා ඉදිවූ ගෘහය (මැදිරිගිරිය වටදාගෙය/පොළොන්නරුව ව..)

**<u>වාහල්කඩ</u>**: ස්තූපවල ගර්භයේ සිව් දෙසින් තනා ඇත (මිහින්තලේ කණ්ඨක චෛත්‍ය)

**<u>බෝධිඝර</u>**: බෝධිය වටා ඉදිවූ පියස්ස (කුරුණෑගල නිල්ලක්කම බෝධිඝරය)

**<u>සඳකඩපහණ/අඩ්ඩචන්ද්‍රපාසාණ</u>** - අනුරාධපුර බිසෝ මාලිගය
*අනුරාධපුර යුගයට අයත් සඳකඩපහණින් භව චක්‍රය නිරූපනය වේ (මහාචාර්ය සෙනරත් පරණවිතාන)

**<u>කොරවක්ගල</u>**: පියගැටපෙල දෙපස පිහිටි අත්වැල

බුදු දහම ස්ථාපිත වූ පසු මෙරට ඉදිවූ ප්‍රථම ස්තූපය :
ථූපාරාමය - දකුණු අකු ධාතූන් වහන්සේ - දේවානම්පියතිස්ස රජු

**<u>බුදු පිළිම වර්ග 3කි</u>**

1. හිටි පිළිම: අවුකන (ආබද්ධ) , මාළිගාවෙල (අනාබද්ධ)
2. හිඳි පිළිම : අනුරාධපුර සමාධි පි., තොලුවිල සමාධි පිළිමය
3. සැතපෙන / ඔත් පිළිම : පොළොන්නරුව ගල් විහාරය, තන්තිරිමලේ සැතපෙන පිළිමය

- චංකමන-සක්මන් ඉරියව්ව - තිවංක ප්‍රතිමා ගෘහය

**<u>මුද්‍රා</u>** : 6කි

| | |
|---|---|
| ධ්‍යාන | - භාවනානුයෝගී ඉරියව්ව (සමාධි පිළිමය) |
| අභය | - සසර බිය දුරු කිරීම(අවුකන/ගල් විහාර ප්‍රතිමා) |
| විතර්ක | - ගැටලු විසඳීම |
| ධර්ම චක්‍ර | - ධර්මය පැහැදිලි කිරීම |
| වරද | - වරදානය |
| භූමි ස්පර්ශ | - මාර පරාජයේදී පොලොව සාක්ෂි දැරීම (හිඳි පිළිමවල පමණක් දක්නට ඇත) |

ආසන : හිඳි පිළිමවල පාද පිහිටුවා ඇති ආකාරය

වීරාසනය , භද්‍රාසනය
පද්මාසනය

පිළිම නෙළීමට පෙර වන්දනාමාන කර ඇති පූජනීය වස්තු :

බෝධිය, වජ්‍රාසනය, ධර්ම චක්‍රය, සිරි පතුල, පද්මය, ස්තූපය



*සැකසුම - ඩී.එම්.එස්.එන්.හංසිකා*

# බප/කළු සාන්ත මරියා විද්‍යාලය, මග්ගොන

## *බුද්ධ ධර්මය - කෙටි සටහන්*

**<u>අනුරාධපුර යුගයේ චිත්‍ර</u>** - සීගිරිය, හිඳගල

**<u>පොළොන්නරු යුගයේ චිත්‍ර</u>** -
මහියංගන ස්තූපයේ ධාතු ගර්භය
දිඹුලාගලලෙන
තිවංක පිළිම ගෙය(බුදුරදුන් දෙව්ලොව සිට සංකස්ස පුරයට වැඩම කිරීම,සස/වෙස්සන්තර/සාම ආදී ජාතක කථා)

**<u>මහනුවර යුගයේ චිත්‍ර</u>** - දෙගල්දොරුව, මැදවල, දඹුල්ල, රිදී විහාරය, බඹරගල , කැළනිය
චිත්‍ර ශිල්පීන් - දෙවරගම්පොල සිල්වත් තැන, හිරියාලෙ නයිදෙ, දේවේන්ද්‍ර මූලාචාරියා

**<u>නූතන යුගයේ චිත්‍ර</u>** -
රිචඩ් හෙන්රිකස් - ගුන්ඩ්පාස්භි ජයතිලකාරාමය,ජිනරාජවංශය ග්‍රන්ථයට ඇඳි සිතුවම්
එම්.සාර්ලිස් - කොළඹ මාලිගාකන්ද විහාරය, අශෝකාරාමය, ඉසිපතනාරාමය, වේළුවනාරාමය, පොතුපිටිය පූජාරාමය
සෝලියස් මෙන්දිස් - කැළනිය, මාවිල සුමනකුසුමාරාමය, රනස්ගල්ල විහාරය , මැද්දෙපොල විහාරය
ජෝජ් කීට් - බොරැල්ල ගෝතමී විහාරය
ඇල්බට් ධර්මසිරි - වෙහෙරගොඩැල්ල විහාරය
සෝමබන්දු විද්‍යාපති - බෙල්ලන්විල විහාරය

**<u>ප්‍රතිමාඝර</u>** (ප්‍රතිමා සඳහා ඉදිවූ ගෘහය) : වර්ග 3 කි

ගන්ධ කුටි - (තොලුවිල, පන්කුළිය,කිරිබත් වෙහෙර)
පාසාද - (රත්න ප්‍රාසාදය,බිසෝ මාලිගා ගොඩනැගිල්ල)
ගෙඩිගේ - (නාලන්දා ගෙඩිගේ , ලංකාතිලකය, තිවංක පිලිමගෙය)

- ටැම්පිට විහාර (මහනුවර යුගයේ දී ඉදිවූ පිළිම ගෙවල් විශේෂයකි)

හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි - කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ඇරඹීය

රත්මලානේ ධර්මාලෝක හිමි - කැළණියේ පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ඇරඹීය

රිස් ඩේවිඩ්ස් : එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම පිහිටුවීය

හික්ෂූන්ට කායික ව්‍යායාමයක් ලෙස සක්මන් මළුව අනුමත කළේ - ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම පරිදිය

බිම්බිසාර රජු - වේළුවනාරාමය
අනේපිඬු සිටුතුමා - ජේතවනාරාමය
විශාඛා සිටු දේවිය - පූර්වාරාමය

බුදු රදුන්ගේ බාහිර පෞරුෂය කෙරෙහි පැහැදීම හේතුවෙන් පැවිදි වූයේ - වක්කලී හිමියන්

ඍතු තුන : ගිම්හාන, හේමන්ත, වස්සාන
මාලිභා තුන : රම්‍ය, සුරම්‍ය, සුභ

චරිතයට සුදුසු කමටහන් ලබා රහත් බවට පත් වූ සැරියුත් හිමිගේ ගෝල නම වන්නේ - ස්වර්ණකාර හිමියන්

සිදුහත් කුමරු විවාහ වූයේ : යශෝධරා දේවිය සමග(හද්දකච්චානා කුමරිය/බිම්බා දේවිය)

යශෝධරා දේවියගේ පියා : සුප්‍රබුද්ධ රජු

තනතුරු ප්‍රදානය පිළිබඳ චෝදනා එල්ල කළේ : චන්න හිමි

බුදුරදුන් විසින් මහා කරුණාවෙන් තම පිහිට ලැබිය යුත්තන් කවුරුන්දැයි සොයා බැලූයේ - පැසුළුයම් කිස ආරම්භයේදීය

නිබ්බුත පද කීවේ : කිසා ගෝතමිය

<u>ස්වභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ අවස්ථා</u>

1 වස් කාලය :බරණැස ඉසිපතනය (මුවන්ගේ අභය භූමියකි)
2,3,4වන වස් කාලයන් :වේළුවනාරාමය ( උණ ගසින් සැදි ලේනුන්ගේ අභය භූමියකි)
10 වන වස කාලය :පාරිලෙය්‍ය වනය

<u>ස්වභාවික පරිසරය ආශ්‍රිතව දම් දෙසූ අවස්ථා</u>

දම්සක් පැවතුම් සූත්‍රය : බරණැස ඉසිපතන මිගදාය
සාමඤ්ඤඵල සූත්‍රය : ජීවක අඹ උයන
කසී භාරද්වාජ සූත්‍රය ; කෙත් යායකදී

සිදුහත් කුමරුගේ ගුරුවරයා - සර්ව මිත්‍ර බමුණා

සුද්ධෝදන රජුගේ ගුරුවරයා - අසිත හෙවත් කාලදේවල තවුසා (ධ්‍යාන ලාභියෙකි)

සිදුහත් බෝසතාණන්ගේ ගුරුවරුන් -
- භග්ගව තවුසා
- ආලාරකාලාම තවුසා - සප්ත සමාපත්ති ලාභියෙකි
- උද්දකරාමපුත්ත තවුසා - අෂ්ට සමාපත්ති ලාභියෙකි

**<u>අවිධිමත් ලෙස ආහාර අනුභව කරන්නන් 5 දෙනෙකි</u>**.

1.ආහාර හත්ථක - උදව් නැතිව නැගිටින්නට බැරි තරමට ආහාර ගන්නා තැනැත්තා
2.අලංසාටක - ඇඳුම් ගැනවත් නොසලකා ආහාර ගන්නා තැනැත්තා
3.තත්ථාවට්ටක - නැගිටීමට බැරිව එහිම පෙරලී සිටින්නා
4.කාකමාසක - උගුරටම පිරෙනතුරු ආහාර ගන්නා...
5.භුත්තවමිතක - අනුභව කළ ආහාර වමාරා නැවත ආහාරයට ගන්නා...

අගසව් දෙනම:- සැරියුත් හිමි (උපතිස්ස) මුගලන් හිමි (කෝලිත)

කොසොල් රජු විසින් හෙළි කළ ශ්‍රද්ධාවන්ත වඩුවන් දෙදෙනා වන්නේ : ඉසිදත්ත පුරාණ

*සැකසුම - ඩී.එම්.එස්.එන්.හංසිකා*

# බුද්ධ ධර්මය - කෙටි සටහන්

| | ප්‍රථම සංගායනාව | දෙවන සංගායනාව | තෙවන සංගායනාව | සිව්වන සංගායනාව |
|---|---|---|---|---|
| බුද්ධ පරිනිර්වාණයෙන් | මාස 3කට පසු | වසර 100කට පසු | වසර 236කට පසු | ක්‍රි.පූ.1වන සියවස |
| ප්‍රධාන හේතුව | සුභද්‍ර භික්ෂුවගේ අභද්‍ර වචනය | වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස අකැප වස්තුව | දුසිල් මහණුන් සසුන්ගත වීම | ත්‍රිපිටකාධාරී භික්ෂූන් හා ධර්මය විනාශවීමේ අවධානම |
| මූලිකත්වය | මහා කාශ්‍යප රහතන් වහන්සේ | සබ්බකාමී රහතන් වහන්සේ | මොග්ගලීපුත්ත තිස්ස රහතන් වහන්සේ | - |
| දායකත්වය | අජාසත් රජු | කාලාශෝක රජු | ධර්මාශෝක රජු | ප්‍රාදේශීය නායකයකු |
| ස්ථානය | රජගහ නුවර,වේභාර පර්වතය පාමුල, සප්තපර්ණී ගුහාව ඉදිරිපිට | විශාලා මහනුවර වාලුකාරාමය | පැළලුප් නුවර අශෝකාරාමය | මාතලේ අලුවිහාරය (ශ්‍රී ලංකාව) |
| ගත වූ කාලය | මාස 7 | මාස 8 | මාස 9 | |
| සහභාගී වූ ප්‍රමාණය | 500 | 700 | 1000 | 500 |
| වෙනත් නම් | පංචසතිකා සංගීතිය | සත්තසතිකා සංගීතිය | සාහස්සිකා සංගීතිය | පුස්තකාරූඪ සංගීතිය |
| ප්‍රතිඵල | ✓ විසිරී පැවති ධර්මය ඒකරාශී කිරීම<br>✓ ධර්ම විනය කොටස් කර භාණක පරපුරට පැවරීම | ✓ දස අකැප වස්තුව ප්‍රතික්ෂේප කිරීම<br>✓ ශික්ෂාපද ලිහිල් නොකොට පවත්වාගෙන යාම<br>✓ අටළොස් නිකාය බිහිවීම | ✓ දුසිල් මහණුන් සසුනෙන් නෙරපීම<br>✓ දේශීය විදේශීය ධර්ම ප්‍රචාරය<br>✓ කථාවත්ථුප්පකරණය ඇතුළත් අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීම<br>✓ ත්‍රිපිටකය අංග සම්පූර්ණ වීම | ✓ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම |

## කණිෂ්ක ධර්ම සංගායනාව (සර්වාස්තිවාදී සංගායනාව)

- ✓ භාරතයේ පැවති 4 වන සංගායනාවයි (ථේරවාද ධර්ම සංගායනාවක් නොවේ)
- ✓ මූලිකත්වය - පාර්ශව තෙරුන්
- ✓ සර්වාස්තිවාදී භික්ෂූන් 500ක් සම්බන්ධ විය
- ✓ දායකත්වය - කණිෂ්ක රජු
- ✓ සංගායනාවට හේතු -
  - *. නිකාය වශයෙන් බෙදුණු සංඝ සමාජය විවිධාකාරයෙන් ධර්මය විවරණය කිරීම
  - *. සර්වාස්තිවාදී ධර්මයට අනුව අටුවා සම්පාදනයේ අවශ්‍යතාව
- ✓ ප්‍රතිඵල -
  - විභාෂා නම් සර්වාස්තිවාදී ධර්මයට අනුව අටුවා සම්පාදනය
  - අටුවා ග්‍රන්ථ තඹ පත්වල ලියා ස්තූපයක තැන්පත් කිරීම
  - පාලියෙන් පැවති ත්‍රිපිටක ධර්මය සංස්කෘත භාෂාවට පරිවර්තනය කිරීම
  - මහායාන සම්ප්‍රදාය ආරම්භ වීම
  - මධ්‍යම ආසියාවේ මහායාන ධර්මය ප්‍රචාරය කිරීම

ථේරවාද බෞද්ධ සම්ප්‍රදායට අයත් 5වන හා 6වන සංගායනා මියන්මාරයේ(බුරුමය) පැවැත්වුණි

මහින්දාගමනය - මිහිඳු හිමියන් ලක්දිවට වැඩම කිරීම
(බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236කට පසුව
දේවානම්පියතිස්ස රජුගේ 1 වන රාජ්‍ය වර්ෂය
ධර්මාශෝක රජුගේ 18වන රාජ්‍ය වර්ෂය)

දුමින්දාගමනය - දඹදිව ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව සමග සංඝමිත්තා තෙරණිය මෙරටට වැඩම කිරීම

| මහින්දාගමනයට පෙර ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස | | මහින්දාගමනයෙන් පසුව ... |
|---|---|---|
| ✓ වෘක්ෂ වන්දනාව | → | බෝධි වන්දනාව |
| ✓ ගිනි දෙවියන් පිදීම | → | බුදුරදුන් පිදීම / දෙවියන්ට පින්දීම |
| ✓ මළවුන් ඇදහීම | → | මළවුන්ට පින් අනුමෝදන් කිරීම |
| ✓ ගල්පර්වත ඇදහීම | → | චෛත්‍ය හා බුදු පිළිමවලට වන්දනා කිරීම |

## බුදු දහමත් සමග අප ලත් දායාද

- ✓ අරිට්ඨ කුමරු පැවිදි වීමෙන් භික්ෂු සමාජය ආරම්භ වීම
- ✓ ලක්දිව පුරා වෙහෙර විහාර ඉදිවීම
- ✓ මහා විහාරය කේන්ද්‍ර කොටගෙන ජාතික අධ්‍යාපන ක්‍රියාවලිය ආරම්භ වීම ( මහා විහාරයට අයත්ව තිබූ ගොඩනැගිලි - තංගුත්ත පිරිවෙන, කාලපාසාද පිරිවෙන )
- ✓ භාරතීය බ්‍රාහ්මී අක්ෂර පදනම්ව සිංහල අක්ෂර මාලාව සකස් කිරීම
- ✓ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණය කිරීම
- ✓ අනුලා බිසව පැවිදි වීමෙන් භික්ෂුණී සමාජය ආරම්භ වීම
- ✓ බුද්ධ ප්‍රතිමා, සුවිසල් සෑයවල් ඉදිවීම
- ✓ විහාරාරාම ආශ්‍රිතව චිත්‍ර, මූර්ති, කැටයම් ආදී කලාකෘති බිහිවීම
- ✓ බෞද්ධ මූලාශ්‍ර පදනම් වූ සාහිත්‍ය කෘති බිහිවීම
- ✓ විධිමත් වන්දනාමාන හා පූද සිරිත් පද්ධතියක් බිහිවීම
- ✓ බෞද්ධ ඉගැන්වීම් අනුව දැහැමි රාජ්‍ය පාලන ක්‍රමයක් ඇතිවීම
- ✓ උසස් සාරධර්ම වලින් යුත් සමාජයක් බිහිවීම



සැකසුම - ඩී.එම්.එස්.එන්.හංසිකා

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

# බුද්ධ ධර්මය - කෙටි සටහන්

## දුටුගැමුණු රජතුමා

- මව : විහාරමහා දේවිය
- පියා : කාවන්තිස්ස රජු (රුහුණේ පාලකයා )
- සොහොයුරා : සද්ධාතිස්ස රජු
- විදේශ බලවේගයන්ගෙන් රට බේරාගැනීමේ අපේක්ෂාවට පියාගේ වූ අකමැත්ත නිසා පියාගෙන් ඈත්ව කොත්මලේ ප්‍රදේශයේ ජීවත් විය(එවකට අනුරාධපුරය අගනුවර කොටගෙන එළාර රජු රට පාලනය කළ අතර ඊට පෙර සේන, ගුත්තික යන දකුණු ඉන්දීය ආක්‍රමණිකයන් ...)
- පියාගේ අභාවයෙන් පසු,විජිතපුර සටනින් එළාර රජු පරදා රට එක්සේසත් කළේය
- රුවන්වැලි සෑය,මිරිසවැටිය,ලෝවාමහපාය ඉදිකළේය
- දේවානම්පියතිස්ස රජු ඇරඹූ මහාවිහාරය අංග සම්පූර්ණ බෞද්ධ මධ්‍යස්ථානයක් කළේය
- ඊට අමතරව විහාර 68ක් ඉදිකළ බව සඳහන් වේ
- වසර 24ක් රජකම් කළ අතර වෙසක් උත්සව 24ක් පවත්වා ඇත
- ආරෝග්‍යශාලා පිහිටුවන ලදී
- සෑම ගමකම ධර්ම දේශනා පැවැත්වීමට කටයුතු කළේය
- තමා කළ යහපත් ක්‍රියා පින් පොතක සටහන් කළේය
- “මාගේ මේ වෑයම බුදුසසුනේ චිරස්ථිතිය පිණිස මිස රජ සැප පිණිස නොවන්නේය” - රජුගේ අභීත සටන් පාඨයයි

## වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමි

- මහනුවර යුගයේදී (ක්‍රි.ව.1480-1815) පිරිහී ගිය ශාසනය නගා සිටුවීමට පුරෝගාමී විය
- උපත : 1698 ජූනි 18 උඩරට තුම්පනේ වැලිවිට ප්‍රදේශයේදී කුලතුංග බණ්ඩාර නමින්...
- අවු.16දී මහනුවර සූරියගොඩ විහාරයේදී වැලිවිට සරණංකර නමින් පැවිදි විය
- උඩරට රාජධානිය නායක්කර් වංශික අබෞද්ධ රජවරුන්ගේ පාලනයට යටත්ව සංස්කෘතික පරිහානියකට ලක්ව තිබූ එකල පොත්පත්,ගුරුවරුන් සොයාගැනීම දුෂ්කර විය
- සිංහල,පාලි,සංස්කෘත,බුද්ධ ධර්මය,කාව්‍ය ශාස්ත්‍රය වැනි විෂයන් ස්වෝත්සාහයෙන් උගත්තේය
- පිරිහෙමින් පැවති ශාසනය නගාසිටුවීමට “සිල්වත් සමාගම” පිහිටුවිය
- උපසම්පදා භික්ෂූන් මෙරට නොසිටි නිසා කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ උදව්වෙන් සියම්(තායිලන්තයෙන්) රටින් උපාලි තෙරුන් ඇතුළු උපසම්පදා භික්ෂූන් 20ක් වඩමවා 1753 දී උපසම්පදාව ලබා මෙරට ශාසනික පුනරුදයක් ඇති කළහ
- කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් සඟරජ පදවිය පිරිනමන ලදී
- තල්පතක “උඩගු නොව මහණ” ලෙස ලියා ආරාමයේ පිවිසුම් දොරටුවේ අලවා තැබූහ

**වෙනත් ශාසනික සේවා**

- උඩුනුවර නියමකන්දේ පිරිවෙනක් පිහිටුවිය
- අනුරාධපුර,පොළොන්නරුව,දඹුල්ල ආදී ස්ථානවල බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම
- මහනුවර දේවාල පෙරහැරට, දළඳාවහන්සේට උපහාර පිණිස “මාලිගාවේ මහ පෙරහැර” එක් කිරීමට ක්‍රියා කිරීම
- ධර්ම ග්‍රන්ථ රචනා කිරීම
  *.මුණිගුණාලංකාරය *.සතර බණවර සන්නය
  *.රතනත්‍රය ප්‍රණාම ගාථා සන්නය *.සාරාර්ථ සංග්‍රහය

- ආදර්ශ : -
  නිරහංකාර බව — අල්පේච්ඡ ජීවිතය
  අධිෂ්ඨානය — දුෂ්කරතා[illegible] ලැබීම
- අවු.80 දී (1778 ඇසළ පෝ දින) අපවත් වූහ

## අනගාරික ධර්මපාලතුමා

- උපත :1864 සැප්තැම්බර් 17
- නම : දොන් ඩේවිඩ් හේවාවිතාරණ
- මව : මල්ලිකා ගුණවර්ධන මැතිනිය , පියා : දොන් කරෝලිස් හේවාවිතාරණ මහතා
- අධ්‍යාපනය ලැබුවේ ක්‍රිස්තියානි පාසල්වලය
- පන්සල ඇසුරු කිරීමෙන් ජීවිතය වෙනස් විය
- 1873 පානදුරාවාදය ලොව පුරා ප්‍රසිද්ධ වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෙරටට පැමිණි හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා “පරම විඥානාර්ථ ”සමාගම පිහිටුවා “සරසවි සඳරුස” පුවත්පත ද ඇරඹීය
- ඕල්කට් තුමාගේ දේශන අසා ඔහු සමග වැඩ කිරීමට තීරණය කළ ඩේවිඩ් තරුණයා රට වටා ගොස් ඕල්කට්තුමාගේ දේශන සිංහලට පරිවර්තනය කලේය.තම විදේශීය නමද වෙනස් කලේය
- ගවමස්කෑමට,සුරා පානයට එරෙහිව දේශන පැවැත්විය
- ඕල්කට් තුමා සමග එක්ව ඉරිදා පාසල් 50කට අධික සංඛ්‍යාවක් ඇරඹීය
- මහන්තා නැමැත්තාගෙන් බුද්ධගයාව බේරාගන්නා ලදී. (සිංහලයිනි නැගිටිවු - බුද්ධගයාව බේරාගනිව් )
- එංගලන්තයේ ලන්ඩන් බෞද්ධ මධ්‍යස්ථානය, කල්කටාවේ ධර්මරාජික මහා විහාරය, බරණැස මූලගන්ධකුටි විහාරය ආදිය ඉදිකලේය
- 1931 දී (57වන වියේදී) ගිහියෙකු ලෙස අවසන් දේශනය විද්‍යෝදය පිරිවෙනේදී සිදුකලේය
- සිරි දේවමිත්ත ධර්මපාල නමින් පැවිදි වී 1933 ජනවාරි 16 දින උපසම්පදාව ලබා ගත්තේය
- “සම්බුදු සසුන බේරා ගැනීමට තවත් 25 වතාවක් දඹදිව ඉපදේවා” යන පැතුම සහිතව 1933 අප්‍රේල් 29 වන දින අපවත් වූහ

## රේරුකානේ චන්ද්‍රවිමල මහනාහිමි

- උපත : 1897 ජූලි 19 දී කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ආසන්නයේ රේරුකාන ගමේදී
- නම : රුබල් ගුණවර්ධන
- මව : මුණසිංහගේ පොඩි නෝනා මාතාව
- පියා : පවුලිස් ගුණවර්ධන මහතා
- බුරුම ජාතික විනයාලංකාර හිමියන් යටතේ 1906.01.27 දින පැවිදි විය
- 1908 දී බුරුමයට වැඩම කොට බුරුම භාෂාව,සූත්‍ර,විනය,අභිධර්මය ප්‍රගුණ කළහ
- 1917 බුරුමයේ ධම්මිකාරාම සීමාවේදී උපසම්පදාව ලබා ගත්හ
- පසුව මෙරටට වැඩම කොට දෙමටගොඩ මහා විශුද්ධාරාම පන්සලේ වැඩ විසීය
- ග්‍රන්ථ 25කට වඩා රචනා කර ඇත
  *.පොහොය දිනය *.ධර්ම විනිශ්චය
  *.බෞද්ධයාගේ අත්පොත *.පාරමිතා ප්‍රකරණය
  *.අභිධර්ම මාර්ගය
- මුදල් පරමාර්ථයකින් තොරව ග්‍රන්ථ රචනා කළ අතර ඕනෑම අයෙකුට ඒවා උපුටා ගැනීමට තහනමක් නැති බව සඳහන් කර ඇත

- **උපාධි සහ ගෞරව නාම**
  - ✓ ප්‍රාචීන භාෂෝපකාර සමාගම - සම්මාන පණ්ඩිත උපාධිය
  - ✓ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය - අභිධර්මය පිළිබඳ මහාචාර්ය පදවිය සහ සාහිත්‍ය චක්‍රවර්ති උපාධිය
  - ✓ අනුරාධපුර බුද්ධ ශ්‍රාවක විශ්වවිද්‍යාලය - ප්‍රවචන විශාරද සම්මාන උපාධිය
  - ✓ ශ්‍රී ලංකා ශ්වෙජින් නිකායේ මහනායක පදවිය (1976)
  - ✓ අමරපුර සංඝ සභාව - අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන සෝභන ගෞරව නාමය
- 1997 ජූලි 4 දින් අපවත් වූ අතර උන්වහන්සේගේ ඉල්ලීම අනුව සරලව අවසන් කටයුතු කරන ලදී

WWW.PastPapers.WiKi



සැකසුම - ඩී.එම්.එස්.එන්.හංසිකා

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]